නාඋල ප්‍රාදේශීය සභාව - 2020
-----------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 තත්ත්වාගණනය කළ මතය

නාඋල ප්‍රාදේශීය සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට නාඋල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උපවගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

------------------------------------------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තව දුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව ප්‍රාදේශීය සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාල සීමාවන් තුළ සහ අදාළ නීති, රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩසටහන යටතේ හැලබගහවත්ත මාර්ගය කොන්ක්‍රීට් යොදා සංවර්ධනය කිරීමේ කර්මාන්තයට අදාළව ගෙවිය යුතු රු.99,737 ක් ණය හිමියන් යටතේ ගිණුම්ගත නොකර ගෙවියයුතු පොදු තැන්පත් ලෙසට ගිණුම්ගත කර තිබුණි. | 2021 වර්ෂයේ ගිණුම්වල නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ගිණුම් ශේෂ නිවැරදි කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) සමාලෝචිත වර්ෂයේ අවසාන දින වන විට ගිවිසුම්වලට එළඹ නොතිබුණු පහල බොබැල්ල අතුරු මාර්ගය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියේ රු.200,000 ක ඇස්මේන්තු වටිනාකම ණයහිමියන් යටතේ ගිණුම්ගත කර තිබුණි. | 2021 වර්ෂයේ ගිණුම්වල නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ගිණුම් ශේෂ නිවැරදි කළ යුතු වීම. |

## 1.7 අනුකූල නොවීම්

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම්**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) පාර්ලිමේන්තු පනත් | | | |
| (i) 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනත 22(1) වගන්තිය | නාඋල හබරකඩ පිහිටි අක්කර 5 ක ඉඩමක් ලැන්ඩ් සේල් ආයතනයක් විසින් 2015 වර්ෂයේදී අනුබෙදුම් කර විකිණීමේදී ප්‍රාදේශීය සභාවට ලැබිය යුතු පර්චස් 78.88 ක ඉඩම් කොටසින් රු.1,867,680 ක් වටිනා පර්චස් 51.88 ක කොටසක් ප්‍රාදේශීය සභාව ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | නීතිමය කටයුතු කිරීම සඳහා අදාල ලියවිලි නීතිඥවරයා වෙත යොමු කර ඇත. | ඉඩම් කොටස් ලබා ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (ii) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත 154(1) වගන්තිය | නාඋල හබරකඩ පිහිටි අක්කර 5 ක පමණ ඉඩමෙන් ලැබිය යුතු සියයට 1 ක බදු මුදල ලෙස ඉඩම් කොටස්වල රු.17,565,000 ක තක්සේරු වටිනාකම මත රු.175,650 ක මුදලක් අයකරගෙන තිබුණ ද, විකුණුම් වටිනාකම සොයා බලා අයවියයුතු නියමිත මුදල විකුණුම්කරුගෙන් අයකරගෙන නොතිබුණි. | අයකර ගැනීමට නීතිමය පියවර ගෙන ඇති බව. | අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය<br>මුදල් රෙගුලාසි 104(4) | සභාවට අයත් කැබ් රථයක් 2019 නොවැම්බර් 17 දින අනතුරකට ලක්වී තිබුණද, 2020 ඔක්තෝබර් 06 දින වන විටත් පරීක්ෂණයක් සිදුකර නොතිබුණි. එමෙන්ම මෙම වාහනය අනතුරට ලක්වීම නිසා රු.545,973 ක අළුත්වැඩියා වියදමක් දැරීමට සිදුවී තිබුණද රක්ෂණාවරණය ලෙස රු.289,685 ක් පමණක් ලැබී තිබීම හේතුවෙන් සභා අරමුදලට රු.256,288 ක පාඩුවක් සිදුවී තිබුණි. | වන්දි ලබා ගැනීම සඳහා නීතිමය ක්‍රියාමාර්ග ආරම්භ කර ඇති බව. | විධිමත් ක්‍රියාමාර්ග අනුගමනය කර පාඩුව ආවරණය කරගත යුතුය. |
| (ඇ) 2010 පෙබරවාරි 03 දිනැති අංක එස්පී/ආර්ඩී/02/10 දරන රජයේ ඉඩම් කළමනාකරණය සම්බන්ධ ජනාධිපති ලේකම්ගේ චක්‍රලේඛය<br>3.5 ඡේදය | ඉඩම් ආඥාපනතේ 27 වන වගන්තිය යටතේ පැවරුම් නියෝගයක් මඟින් 2007 වර්ෂයේදී නාඋල ප්‍රාදේශීය ලේකම් විසින් අංක 254 මූලික පිඹුරෙන් ප්‍රාදේශීය සභාව වෙත පවරා දෙන ලද පර්චස් 10.56 ක කැබලි අංක 595 හා 596 දරන ඉඩම් කොටස් දෙක කිසිදු අනුමැතියකින් තොරව බාහිර පාර්ශවයන්ට භුක්ති විඳීමට ඉඩකඩ ලබාදී තිබුණි. | පදිංචිකරුවන්ට විධිමත් පරිදි කුලී ගිවිසුමකට එළඹෙන ලෙස දන්වා ඇති බව. | චක්‍රලේඛ උපදෙස්වල ට අනුව කටයුතු කළ යුතු වීම. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ පුනරාවර්තන ආදායම රු.1,655,297 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ පුනරාවර්තන ආදායම රු.2,703,627 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

**ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වරිපනම් ඒකක 380 කට අදාලව අයවියයුතු හිඟ වරිපනම් ශේෂය රු.1,883,175 ක් විය. මෙම ශේෂය තුළ වසර 5 කට අධික කාලයක සිට අය නොවී පවතින හිඟ පරිපනම් ශේෂයන් සම්බන්ධයෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 හා 155 වගන්ති අනුව හා 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති මාලාවේ 33 පරිදි කටයුතු කර නොතිබුණි. | කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් හිඟ ශේෂයන් අයකර ගැනීමට නොහැකි බව. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරිම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කාර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | 2012 වර්ෂයේ දඹුල්ල ප්‍රාදේශීය සභාවෙන් වරිපනම් ගාස්තු අයකිරීම සඳහා ලැබී තිබූ පරිගණක මෘදුකාංගයට වරදවා තොරතුරු ඇතුළත් කිරීමෙන් හා මෘදුකාංගයේ දෝෂයන් හේතුවෙන් දීර්ඝ කාලීනව වැරදි වටිනාකම් ලැබීම මත 2018 දෙසැම්බර් 31 දින වන විට පැවැති රු.1,571,488 ක හිඟ ශේෂය වරිපනම් | මෘදුකාංගයේ දෝෂ හේතුවෙන් මෙම වරද සිදු වී ඇති බව. | නොසැසඳීම්වලට හේතු සොයා බලා කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | ලේඛන අනුව පැවැති ශේෂය සමග නොසැසඳෙන බව අනාවරණය කරගෙන තිබුණි. එම නොසැසඳීම්වලට හේතු සොයාබලා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි. | | |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ 5 ක එකතුව රු.10,104,142 ක් අයකරගෙන නොතිබුණු අතර, ඉන් වසර 1 ට වැඩි හා වසර 5 ට අඩු එකතුව රු.2,470,549 ක ශේෂයන් හා වසර 5 ට වැඩි කාලයක් තිස්සේ පවතින ශේෂය රු.743,955 විය. | පිළිගන්නා බව. | හිඟ ශේෂයන් අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂ 2 ක එකතුව රු.3,429,778 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණු අතර, ඉන් වසර 1 ට වැඩි හා වසර 5 ට අඩු එකතුව රු.555,159 ක් හා වසර 5 කට වැඩි ශේෂය රු.3,240 ක් වී තිබුණි. | පිළිගන්නා බව. | හිඟ ශේෂයන් නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (ඈ) | 2008 ජනවාරි 25 දිනැති අංක 1533/16 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ (ආ) කොටසෙහි 27 හා 28 ඡේදයන්ට අනුව ඝන අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය හා බැහැර කිරීමේ ස්ථාන සඳහා පාරිසරික බලපත්‍රය ලබාගෙන නොතිබුණි. | ඉඩම පවරා ගැනීමෙන් පසුව පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබා ගැනීමට කටයුතු කරන බව. | පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබා ගැනීමට කටයුතු කළ යුතු වීම. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය සභාව පරිහරණය කරනු ලබන ඉඩම් කොටස් 17 කට අදාළව ඔප්පු හෝ පැවරුම් නියෝග සකස්කර අයිතිය තහවුරු කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී මෙම ඉඩම් ආරක්ෂා කර ගැනීමට කටයුතු කරන බව. | ඉඩම්වල අයිතිය තහවුරු කර උපයෝජනය කිරීමට කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | නාඋල සතිපොළ කඩ කාමර 04 ක 2012 වර්ෂයේ සිට රු.145,885 ක කඩකුලී ශේෂයක් හිඟ හිටි ලෙස දක්වා තිබුණි. ඉන් 2012 දෙසැම්බර් 20 දින දක්වා ගෙවීම් පැහැර හැර ඇති හිඟය රු.77,285 ක් විය. එදිනෙන් පසු කඩ කාමර 04 මුද්‍රා තැබීමෙන් පසු වැරදි ලෙස බිල් කර රු.68,600 ක හිඟයක් දක්වා රු.145,885 ක සමස්ථ හිඟයක් සේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. මේ සම්බන්ධව සොයාබලා සුදුසු ක්‍රියාමාර්ගයක් අනුගමනය කර නොතිබුණි. | පිළිගනිමි. කපා හැරීමට අනුමැතියට යවා ඇති බව. | නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වීම. |